# රුහුණ විශ්වවිද්‍යාලය

## සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව - 2023/2024

# Master of Development Planning

## (SLQF 9 මට්ටම)

රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් මෙහෙයවනු ලබන ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ පළවෙනි කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පාඨමාලාවේ ලියාපදිංචියට අවශ්‍ය අවම සුදුසුකම්**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යා විෂය ශික්ෂණයක්/ශික්ෂණයන් නියෝජනය කරමින් ලබාගත් පළමු උපාධිය (SLQF 06 වන මට්ටම/විශේෂ උපාධිය හෝ SLQF 05 වන මට්ටම/ සාමාන්‍යවේදී උපාධිය)

II. සමාජීය විෂය ශික්ෂණයන් නියෝජනය කරමින් අර්ස 30 ඇතුලත්වන පරිදි, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ශික්ෂණයක් මූලිකව නියෝජනය කරමින් ලබාගත් පළමු උපාධිය (SLQF 06 වන මට්ටම/විශේෂ උපාධිය හෝ SLQF 05 වන මට්ටම/ සාමාන්‍යවේදී උපාධිය)

III. සංවර්ධන සැලසුම්කරණය පිළිබඳව වසර 2 ක සේවා පළපුරුද්ද සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ශික්ෂණයක් මූලිකව නියෝජනය කරමින් ලබාගත් පළමු උපාධිය (SLQF 06 වන මට්ටම/විශේෂ උපාධිය හෝ SLQF 05 වන මට්ටම/සාමාන්‍යවේදී උපාධිය)

IV. රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි පරිදි සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ දැනුමක් / පළපුරුද්දක් සහිතව NVQ 7 සම්පූර්ණ කර තිබීම. (අවශ්‍ය විකල්ප සුදුසුකම් දැනගැනීම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.)

- **දේශන පැවැත්වීම** — **සෙනසුරාදා පෙ.ව. 8.00 - ප.ව. 5.00 දක්වා**
- **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** — **2023 සැප්තැම්බර් 13**
- **දේශන මාධ්‍ය** — **සිංහල**
- **පාඨමාලා කාල සීමාව** — **අධ්‍යයන වර්ෂ එකක් හෙවත් සමාසික දෙකකි**
- **පාඨමාලා ගාස්තුව** — **රු.150,000.00**

**2. අයදුම්පත් ලබාගැනීම**

අයදුම්පත් කාර්යාලයෙන් ලබාගැනීම සඳහා රු.1500/- ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 322232400000014 (ගිණුම් අංකය ලෙස භාවිතා කරන්න) යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවා ලබාගත් ලදුපතෙහි පිටුපස පාඨමාලවේ නම සහ අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කර රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් තැපෑලෙන් ලබාගැනීමට තමන්ගේ නම හා ලිපිනය ලියූ රු.110/- ක මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලිපි කවරයක් සමඟ පෙර සඳහන් කළ පරිදි රු.1500/- ගෙවා ලබාගත් ලදුපත නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, නො.115, ශ්‍රී ධර්මාරාම මාවත, කොටුව, මාතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2023 අගෝස්තු 31 දිනට පෙර එවිය යුතුය. මීට අමතරව අයදුම්පත් භාගත කිරීම ද (Download ) සිදුකළ හැකිය. (මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් අඩවිය www.fgs.ruh.ac.lk වෙත පිවිසෙන්න) මෙම භාගත කරන ලද අයදුම්පත් ද ඉහත අයුරින් රු.1500.00 ගෙවූ ලදුපත සමඟ ලියාපදංචි තැපෑලෙන් එවිය යුතුය. සම්පූර්ණ කළ අයදුම්පත් එවීමේදී ලිපියේ වම්පස ඉහළ කෙළවරේ **"සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව"** ලෙස සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී,
රුහුණ විශ්වවිද්‍යාලය
2023.08.13